
# සාම ක්‍රියාදාමය ඔස්සේ සංචාරකයන්ට අත වනන ගල්ඔය ජාතික වනෝද්‍යානය

**නිදහස භුක්ති විඳීමේ ප්‍රීතිය වඩාත් දැනෙන්නේ නිදහස අහිමි වූ විටෙකය. එමෙන්ම සාමය මහෞෂධයන් වන්නේ යුද්ධයේ රුදු ගින්නෙන් දැවෙන විටය.**

**යූ.පී.එස්.පතිරණ**

දශකයකට වඩා වසර එකහමාරකට වැඩි කාලයකට දිගහැරෙමින් පවතින ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමය ආශිර්වාදයක් වී ඇත්තේ උතුරු නැගෙනහිර වෙසෙන සිංහල,දෙමළ, මුස්ලිම් ජනවර්ගයන්ට පමණක් නොවේ. උතුරු නැගෙනහිර පළාත්වල ගහකොළ සතා සිව්පාවා ද එම නිදහසේ සුළඟ අද ආක්‍රමණය කරති. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වලට මායිම්ව පිහිටි වැදගත් ජාතික වනෝද්‍යාන සියල්ලම පාහේ අද ජනතාවට විවෘතව පවතින අතර, විශේෂයෙන් නැගෙනහිර පළාතේ පිහිටි ගල්ඔය ජාතික වනෝද්‍යානය ඉන් එක් වැදගත් සංචාරක ආකර්ෂණයක් බවට පත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය දිවංගත මහාමාත්‍ය ඩී.ඇස්.සේනානායක මැතිඳුන් වියළි කලාපයේ ජනතාව සුඛිත මුදිත කිරීම උදෙසා දියත් කළ අසහාය ගොවිජනපද ව්‍යාපාරයක් වන ගල්ඔය නිම්න සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ වනෝද්‍යානයක් වන **"ගල්ඔය ජාතික වනෝද්‍යානය"** ශ්‍රී ලංකාවේ නැගෙනහිර දෙසින් මොණරාගල හා අම්පාර යන දිස්ත්‍රික්කයන්ට අයත් ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත. 1954 පෙබරවාරි මස 12 වැනි දින සිට ජාතික වනෝද්‍යානයක් බවට ප්‍රකාශයට පත් වූ මෙම වනෝද්‍යානය විශාලත්වයෙන් හෙක්ටයාර 25900 ක් පමණ වේ. ගල්ඔය සේනානායක සමුද්‍රයේ ජලාධාර ප්‍රදේශයක් වන නිසාම ජාතික වනෝද්‍යානයක් බවට සංරක්ෂණය කෙරුණු මෙම




**1954 පෙබරවාරි මස 12 වැනි දින සිට ජාතික වනෝද්‍යානයක් බවට ප්‍රකාශයට පත් වූ මෙම වනෝද්‍යානය විශාලත්වයෙන් හෙක්ටයාර 25900 ක් පමණ වේ. ගල්ඔය සේනානායක සමුද්‍රයේ ජලාධාර ප්‍රදේශයක් වන නිසාම ජාතික වනෝද්‍යානයක් බවට සංරක්ෂණය කර ඇත**

වනෝද්‍යානය නැගෙනහිර පළාතේ ජනතාව සතු ඉතා වටිනා පරිසර පද්ධතියක් බවට ද පත් වී තිබේ.

ගල්ඔය ජාතික වනෝද්‍යානයට ළඟා විය හැකි මාර්ග කිහිපයකි. මහනුවර සිට මහියංගනය, අම්පාර හරහා ඉඟිණියාගල මාර්ගය ඔස්සේ ද රත්නපුර, බලංගොඩ, වැල්ලවාය, මොණරාගල, සියඹලාණ්ඩුව මාර්ගයෙන් ඉඟිනියාගලට හැරෙන මාර්ගය ඔස්සේ ද රත්නපුර, පැල්මඩුල්ල, තණමල්විල ඔස්සේ නැවත වැල්ලවාය මොණරාගල සියඹලාණ්ඩුව ඔස්සේ ද වශයෙන් ගල්ඔය ජාතික වනෝද්‍යානය වෙත ළඟාවිය හැකිය. කෙසේ වුව ද කොළඹ සිට ගල්ඔය වනෝද්‍යානයට ළඟා වීමට ඇති කෙටිම මාර්ගය වනුයේ කොළඹ, මහනුවර, මහියංගනය,අම්පාර හරහා වූ කි.මී.370 ක් පමණ දුර වූ මාර්ගය වේ.





ගල්ඔය වනෝද්‍යානය නැරඹීම සඳහා ගොඩබිමෙන් ප්‍රවේශ විය හැකි වුව ද, ශ්‍රී ලංකාවේ ජාතිවාදි අර්බුදය ඇරඹීමට පෙර කාලයේ ගල්ඔය ජාතික වනෝද්‍යානය සංචාරකයන් අතර වඩාත් ජනප්‍රියව පැවතියේ, මෝටර් බෝට්ටුවකින් සේනානායක සමුද්‍රය හරහා ගොස් වනෝද්‍යානයට පිවිසීමේ මාර්ගයයි. එකල මුල්ලේගම සිට කැබැල්ල බොක්ක දක්වා ද අලිවංගුව සිට කොස්සපොල දක්වා ද ජීප් රථයකින් යා හැකි විය.

ඊසාන දිග මෝසම් සුළගින් වර්ෂාව ලබන වියළි මිශ්‍ර සදහරිත වනාන්තර ගනයට අයත් මෙම වනෝද්‍යානය මි.මී.1700 ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලබයි. උස්ව වැඩුණු සවානා නමින් හැඳින්වෙන තණ තලාවෙන් ද එසේ උස ගස් නොමැති තණහුම් වලින් ද සුසැදි ගල්ඔය වනෝද්‍යානය අරළු, බුළු, නෙල්ලි වැනි ඖෂධීය වටිනාකමක් සහිත ශාකවලින් මෙන්ම වැවරණ, හල්මිල්ල, වීර, පළු, කළුවර, මැහෝගනී, ඇටඹ වැනි ශාක වලින් ද සමන්විත වේ. විශේෂයෙන් සවානා තණහුම් ආශ්‍රිතව අරළු, නෙල්ලි, බුළු වැනි ඖෂධීය ශාක මෙන්ම එරමිණියා, ඉලුක්, මානා වැනි පඳුරු ශාක ද පැතිර පවතිනු දැකිය හැකිය.

ගල්ඔය වනෝද්‍යානය ස්වභාවික සෞන්දර්යයෙන් පමණක් නොව ජෛව විවිධත්වය අතින් ද පොහොසත්ය. වනෝද්‍යානය ක්ෂීරපායි සත්ත්ව විශේෂ 32 කට ආසන්න ප්‍රමාණයකට වාසස්ථාන සලසා දී ඇති අතර, දිවියා වලහා, තිත් මුවා, ගෝනා, වැලි මුවා, රිලවා, වඳුරා, වල් ඌරා, කුළු හරකා මෙන්ම වල් අලින් ද වනෝද්‍යානයට අමුත්තන් නොවේ. කෙසේ වුවද වලහා හා දිවියා දැකිය හැකි වන්නේ කලාතුරකින් මෙහි. මීට අමතරව උරග විශේෂ හා මත්ස්‍ය විශේෂ රැසකට නිවහන් සලසන මෙහිදී Crimson Rose, Classy Tiger වැනි සමනළ විශේෂ කිහිපයක් ද දැක බලාගත හැකිය.

විවිධ වර්ගයේ සියොතුන් රැසක් ද මෙම වනෝද්‍යානය තුළ දී දැක බලා ගත හැකිය. ඒ අතර, ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් මෙන්ම සංක්‍රමණික කුරුල්ලන්ද වේ. රතුමුහුණැති මල් කොහා, හබන් කුකුළා, කැඳැත්තා වැනි ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් සමග දියකාවන් තුඹ සේරුන්, කොක්කු විශේෂ ආදී ජලජ පක්ෂීන් රැසක් ද මෙහි දී නිරීක්ෂණය කළ හැකිය.

වනෝද්‍යානය සේනානායක සමුද්‍රය වටකර ගෙන පිහිටා ඇති අතර, මෙහි කඳු සහිත උස් බිම් කිහිපයක් ද වේ. බුද්ධංගල විහාරය හා දීඝවාපී චෛත්‍යය වැනි සිද්ධස්ථාන පිහිටා ඇත්තේ ද මෙම වනෝද්‍යානය ආසන්නයේය. බටහිර මායිමේ ආදි වාසීන්ගේ ගම්බිම් කිහිපයක් ද පිහිටා තිබේ. විශේෂයෙන් නිල්ගල හා රතුගල වැදි පරපුරවල් වෙසෙන වාසස්ථාන හා ඒ ආශ්‍රිත වනයේ ඉතා වටිනාකමින් යුතු දේශීය ඖෂධීය පැළෑටි රැසක් පිළිබඳව අසන්නට ලැබේ.

දශක දෙකක පමණ කාලයක් තිස්සේ පැවති ජාතිවාදී අර්බුදය නිසා අනාරක්ෂිත භාවයට යොමු වී තිබූ වකවානුවේ නීති විරෝධී දැව ජාවාරම්කරුවන් හා දඩයම්කරුවන් පරිසර පද්ධතියට කර ඇති විනාශයේ සළකුණු තවමත් දැකගත හැකි අතර, එබඳු ව්‍යාසනයක් නැවත සිදු නොවීමට නම් සංචාරකයන්ට බියකින් සැකයකින් තොරව නිවී සැනසිලිලේ විවේකයක් ගත කිරීමට මෙහි ළගාවීමට හිතකාමී පරිසරයක් උදාවිය යුතුය. වත්මන් සාම ක්‍රියාදාමය ඔස්සේ එම සිහිනය මල් ඵල ගැන්වේයැයි ජනතාව ඉත සිතින් බලා සිටින බව ද අමතක කළ යුතු නොවේ. ❑